# ඉක්මන් ආණ්ඩු පරිවර්තනයකදී ඉටුකළයුතු

## කර්තව්‍යයන් සඳහා වූ ප්‍රතිපත්තිමය

# යෝජනාවලිය

## 2004 අප්‍රේල් 02 වැනි දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් අනතුරුව පිහිටුවීමට බලාපොරොත්තු වන "එක්සත් ජනතා නිදහස් සන්ධාන" ආණ්ඩුව වෙත දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාවලිය.

**01.** දේශය බෙදා වෙන්කිරීමේ සියලු බලවේගයන් පරාජයට පත් කිරීම සහ ජාතික සමගිය ගොඩනැගීමට ඇපකැප වීම.

**02.** විජාතික බලවේගයන්ගේ වුවමනාව අනුව නැටවෙන, වහල් ආර්ථිකය වෙනුවට, ස්වදේශික ජනතාවගේ අවශ්‍යතාවයන් සහ දැනුම මුල් කොටගත් ලෝකයේ නවීන විද්‍යාත්මක සොයා ගැනීම්වල සාරය උකහාගත් සමෘද්ධිමත් ජාතික ආර්ථිකයක් ගොඩනැගීම සඳහා රට යොමු කිරීම.

**03**. විජාතික බලපෑම් මත සිදු කරමින් පවතින සියලුම ආකාරයේ සංස්කෘතික ආක්‍රමණයන් පරාජයට පත්කොට ජාතික සංස්කෘතික උරුමයන් රැක ගැනීම සහ පෝෂණය කර මතු පරපුරට දායාද කිරීම.

යන කරුණු තුන අරමුණු කොට ගෙන විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලබන විද්වතුන්ගෙන් සැදුම්ලත් දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය ඉදිරියේදී පත්වීමට නියමිත ආණ්ඩුව විසින් පහත සඳහන් පංච මහ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන ලෙසට අයැද සිටින වගනම්,

## 01.) දේශය ආරක්ෂා කර ගැනීම.

I. රුදුරු ත්‍රස්තවාදී සහ බෙදුම්වාදී බලවේග සියල්ල පරාජය කොට ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස පවත්වාගෙන යාම සහතික කිරීම.

II. ත්‍රස්තවාදයට සහ බෙදුම්වාදයට ආධාර සහ අනුබල දෙන සියලු දේශීය සහ විදේශීය බලවේගයන් නිෂ්ක්‍රීය කොට ඉන්දියාව ඇතුළු කලාපය තුළ ඇති අනෙකුත් රාජ්‍යයන්ගේද සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ භූමිය සහ ශ්‍රී ලංකාවේ මුහුදු කලාපය ආරක්ෂා කිරීම.

## 02.) නීතියේ ආධිපත්‍ය ස්ථාපිත කිරීම.

I. කිසිඳු බේදයකින් තොරව රටේ ප්‍රධාන පුරවැසියාගේ සිට සියලුම පුරවැසියන් නීතියේ ආධිපත්‍යට පමණක් යටත්ව කටයුතු කිරීමට බැඳී සිටින පරිදි නීතියේ ආධිපත්‍ය ස්ථාපිත කිරීම.

II. ශ්‍රී ලංකාවේ ජීවත්වන සෑම පුරවැසියෙකුගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කොට ඇති මූලික අයිතිවාසිකම් ඇතුළු සියලු අයිතිවාසිකම් කිසිඳු බේදයකින් තොරව ආරක්‍ෂා කිරීම සහ එකී අයිතිවාසිකම් ආරක්‍ෂා වන ආකාරයේ ක්‍රමවේදයක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

## 03.) දේශීය ආර්ථිකය නංවාලීම.

I. දේශීය කෘෂිකර්මාන්තයට ප්‍රමුඛත්වයක් ලබා දෙන ආර්ථිකයක් නිර්මාණය කොට ගොවි ජනතාව ආරක්‍ෂා කරනු ලබන වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවීම. මෙහිදී දේශීය කෘෂිකාර්මික භාණ්ඩ අපනයනය වර්ධනය කිරීම සහ දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි කෘෂිකාර්මික භාණ්ඩ ආනයනය අධෛර්යමත් කිරීම සිදු කළ යුතුය. තවද දේශීය කෘෂිකර්මාන්තය නංවාලීමට අවශ්‍ය නවීන තාක්‍ෂණය ඇතුළු යටිතල පහසුකම් සියල්ල සපුරාලීම ආණ්ඩුවේ වගකීම විය යුතුය.

II. දේශීය කර්මාන්ත ආරම්භ කිරීම සහ පවතින කර්මාන්ත ආරක්‍ෂා කොට සංවර්ධනය කිරීම සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙළක් දියත් කළ යුතු අතර දේශීය කර්මාන්තකරුවන් ආරක්‍ෂා කිරීම හා දිරිමත් කිරීම මෙන්ම දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි නිමි කාර්මික භාණ්ඩ ආනයනය අධෛර්යමත් කළ යුතුය.

III. ශ්‍රී ලංකාව තුළ පවතින විරැකියාව අවම කොට ශ්‍රම බලකායෙන් උපරිම ඵල ප්‍රයෝජන ලබා ගැනීම. මෙහිදී සේවක අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම සහ මානව හිතවාදී ක්‍රමයක් තුළ ශ්‍රම බලකාය මෙහෙයවීම සිදු කළ යුතුය. මැදපෙරදිග ඇතුළු වෙනත් විදේශීය රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින්ගේ ආරක්‍ෂාව තහවුරු කිරීම සහ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම ආණ්ඩුවේ වගකීමක් ලෙස සැලකිය යුතුය.

IV. දේශීය කෘෂිකාර්මික, කාර්මික සහ සේවා සැපයීම් මත පදනම් වූ දේශීය ව්‍යාපාරයන් ආරම්භ කිරීම, නගා සිටුවීම පිණිස දේශීය ප්‍රාග්ධනය ආයෝජනය කිරීම ධෛර්යමත් කිරීම. මෙහිදී ජාත්‍යන්තර බලපෑම් මත දේශීය ආර්ථිකයට අහිතකර වන ආකාරයේ කිසිඳු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොකිරීමට ආණ්ඩුව වගබලා ගත යුතුය. එසේම අපනයනාභිමුඛ සහ ආනයන ආදේශන ව්‍යවසාය ප්‍රතිපත්තියක් ප්‍රවර්ධනය කළ යුතුය.

## 04.) ජාතික සම්පත් සුරැකීම.

I. ශ්‍රී ලංකාවේ ඉඩම්, ජලය, ඛනිජ, වනාන්තර සහ ජෛව සම්පත් විදේශිකයන්ට අත්පත් කර ගත නොහැකි පරිදි ආරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම. මෙහිදී මෙරට ඉඩම් විදේශිකයන්ට පහසුවෙන් මිලදී ගැනීමට හැකිවන පරිදි ලිහිල්කර ඇති නීති සියල්ල ඉවත්කොට දේශීය ඉඩම්වල හිමිකම මෙරට පුරවැසියන් සතුව තැබීමට ආණ්ඩුව වගබලා ගත යුතුය. විදේශිකයන් විසින් දැනටමත් අත්පත් කරගෙන ඇති ඉඩම් ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

II. ''යළි පුබුදමු ශ්‍රී ලංකා'' වැනි විදේශ ගැති අධිරාජ්‍යවාදී ව්‍යාපෘති යටතේ ජාතික ආර්ථිකය, සංස්කෘතිය, සමාජය සහ දේශීය අනන්‍යතාවයට සිදුකර ඇති විනාශකාරී තත්වයන් ඉවත්කොට ඉදිරියේදී එවැනි ව්‍යසනකාරී ව්‍යාපෘතීන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වීමට ඉඩ නොදිය යුතුය.

## 05.) දේශීය අනන්‍යතාවය සහතික කරනු ලබන අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජ රටාවක් ගොඩනැගීම.

I. අධ්‍යාපනයේ පුළුල් පරමාර්ථ ඉටුවන අයුරින් දේශහිතෛෂී ආකල්ප වර්ධනය වන ආකාරයේ අධ්‍යාපන රටාවක් බිහිකිරීම පදනම් කොටගත් සැලැස්මක් ඇති කිරීම සහ ක්‍රියාත්මක කිරීම. මෙහිදී සියලු ශ්‍රී ලාංකික දූ දරුවන්ට මූලික සහ උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා සමාන අවස්ථාවක් ලබාදීමට ආණ්ඩුව වග බලා ගත යුතුය.

II. අනාදිමත් කාලයක් තිස්සේ ශ්‍රී ලාංකික අප විසින් දිවි පරදුවට තබා ආරක්ෂා කරගනු ලැබූ ඓතිහාසික, සංස්කෘතික, ආගමික උරුමයන් සහ දායාදයන් සුරක්ෂිත කොට පෝෂණය කිරීම සහ සංරක්ෂණය කිරීම. මෙහිදී සමාජමය සාරධර්ම හා ආගමික හර පද්ධතීන් වලට හානි සිදු නොවන ලෙසට ආණ්ඩුව වගබලා ගත යුතුය.

III. බුද්ධ ශාසන කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කිරීම.

IV. අනාදිමත් කාලයක් තිස්සේ ශ්‍රී ලාංකික අප විසින් පෝෂණය කොට ආරක්ෂා කරගනු ලැබූ දේශීය නැටුම්, ගැයුම්, වැයුම්, නාට්‍ය කලාව, සිනමාව, සාහිත්‍ය ඇතුළු සියලු සෞන්දර්යාත්මක, රසෝත්පාදක සංස්කෘතික උරුමයන් සහ දායාදයන් ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම.

V. දේශීය ආගමික, සංස්කෘතික සභ්‍යත්වය සහ සමාජ හර පද්ධතීන් ආරක්ෂා වන ආකාරයේ ආචාර ධර්ම පද්ධතියක් සියලුම මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන් සඳහා සකස් කොට ක්‍රියාත්මක කිරීම.